# හෙගා වෝල් ප්ලාස්ටර්
# HEGA WALL PLASTER - GRAY 100

බිලොක්ගල් බිත්ති සහ ගඩොල් බිත්ති මතුපිට කපරාදු කිරීමකින් තොරව මට්ටම් කිරීම සඳහා නිෂ්පාදනය කර ඇත. මෙමගින් කපරාදුව සඳහා යන වැලි, සිමෙන්ති, ශ්‍රමය සහ කාලය ඉතිරි කර ගත හැක. කපරාදුව සඳහා යන වියදමින් 40% ක පමණ වියදමකින් බිත්ති මට්ටම් කිරීම මෙමගින් සිදු කළ හැක. ඉතා ශක්තිමත්ව දිගුකල් පවතින ලෙස උසස්ම ප්‍රමිතියට අනුකූලව හෙගා වෝල් ප්ලාස්ටර් නිෂ්පාදනය කර ඇත.

## හෙගා වෝල් ප්ලාස්ටර් භාවිතයෙන් ලැබෙන වාසි :

ඉදිකිරීම් සඳහා විශාල වශයෙන් වැලි අවශ්‍ය වන අතර හෙගා වෝල් ප්ලාස්ටර් භාවිතා කිරීමෙන් වැලි සම්පත අත්‍යාවශ්‍ය ඉදි කිරීම් සඳහා පමණක්ම යොදා ගත හැකි වේ. කපරාදුව සඳහා යන වැලි ප්‍රමාණය විශාල වශයෙන් ඉතිරි වන අතර, ගංගා ඇළ දොළ ආදියට වැලි ගොඩ දැමීමෙන් සිදු වන හානියද තරමක් හෝ දුරට අවම කර ගත හැකි හෙයින් හෙගා වෝල් ප්ලාස්ටර් පරිසර හිතකාමී නිෂ්පාදනයක් වශයෙන් හඳුන්වා දිය හැක.

## සැලකිය යුතු කරුණු :

- බිලොක්ගල් බිත්ති සහ ගඩොල් බිත්ති බැඳීම සඳහා බදාම ඇනීමට යොදා ගන්නා වැලි, ගල් කැට හා රොඩු ආදියෙන් තොර විය යුතු අතර හීන් වැලි වීම අවශ්‍යයි. (බදාම මිශ්‍රණයේ ගල් කැට තිබුනහොත් ගල් බැඳීමේදී තරමක් දුරට බිත්ති ඇද වෙනු ඇත.)
- බිලොක්ගල් බිත්ති සහ ගඩොල් බිත්ති කෙලින් බැඳී තිබිය යුතුයි.
- බිත්ති බඳින අතර ස්පොන්ච් කැබැල්ලක් ආධාරයෙන් වප්පාරු (බදාම) එම මොහොතේම පිස දැමීම කළ යුතුයි. එමගින් බිත්ති මතුපිට හොඳින් මට්ටම් වනු ඇත.
- බිලොක්ගල් හෝ ගඩොල් බැඳීමේදී කුස්තුර සහිත ඉරි නොසිටින සේ බැඳිය යුතුයි.
- බිත්ති මත කන්ඩියුට් හා සන්බොක්ස් යෙදීමේදී බිලොක්ගල් හෝ ගඩොල් බිත්තියේ මතුපිටට නොසිටන සේ දැමීම අත්‍යවශ්‍යවේ.
- හෙගා වෝල් ප්ලාස්ටර් භාවිතා කිරීමට ප්‍රථම බිලොක්ගල් බිත්ති හෝ ගඩොල් බිත්ති මතුපිට ජලය යොදා තෙමීමෙන් ශක්තිමත් බව වැඩි කර ගත හැක.

## මිශ්‍රණය සකසා ගැනීම :

සුදුසු භාජනයක් ගෙන හෙගා වෝල් ප්ලාස්ටර් මිශ්‍රණය දමා ඊට ජලය එක් කර හොඳින් මිශ්‍ර කර ගත යුතුයි. ජලය එක් කිරීමේදී 25Kg පැකට්ටුවක් සඳහා ජලය ලීටර් 06 ත් 07 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වේ. හැඩලයකින් බිත්ති මත ඇදීමට (තැවරීමට) හැකි වන සේ මිශ්‍රණය සකසා ගත යුතුයි.

## භාවිතයට උපදෙස් :

- පළමුව පිළියෙල කර ගන්නා ලද මිශ්‍රණය බිලොක්ගල් බිත්ති හෝ ගඩොල් බිත්ති මත හැඩලයක් ආධාරයෙන් එක් අතකට ඇදීම (තැවරීම) කළ යුතුයි. (පළමු ඇදීමට පසු බිත්තියේ ඇති බිලොක්ගල් හෝ ගඩොල් තරමක් දුරට පෙනුනද, දෙවන තැවරීමෙන් පසු එය මුළුමනින්ම වැසී යනු ඇත.)
- ඊට දිනකට පසු දෙවන තැවරුම කළ යුතුයි. දෙවන තැවරීම, පෙර තැවරීමට හරස් අතට තැවරීමෙන් බිත්ති මට්ටම් වීම හොඳින් සිදු වේ. (පළමු දින ඉහළ සිට පහලට ඇද්දේනම් දෙවන දින හරස් අතට ඇදීම සුදුසු වේ.)
- දෙවන තැවරුමෙන් අනතුරුව එම බිත්ති වල හෙගා වෝල් පොටි වයිට් දෙවතාවක් ඇදීමෙන් ඉතා සිනිඳු මට්ටම් බවකින් යුත් පූර්ණ නිමාවක් ලබා ගත හැකියි.

## ආරක්ෂක උපදෙස් :

ඇස් වලට විසුරුනේ නම්, හැකි තරම් පිරිසිදු වතුරෙන් සෝදා හරින්න. අනතුරුව වෛද්‍ය උපදෙස් සඳහා යොමු කරන්න. සම මතුපිට තැවරුනේ නම් පිළිගත් පිරිසිදුකාරකයකින් සෝදා හරින්න. වාෂ්ප සහ ස්ප්‍රේ විසිරුම් ආඝ්‍රානය නොකරන්න. නියමිත ආරක්ෂිත උපකරණ හා මෙවලම් භාවිතා කරන්න.